සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

30636

## 6 - ශ්‍රේණිය
## ඉතිහාසය

නම/විභාග අංකය :- ............................................................................. කාලය : පැය 02යි.

## I කොටස

1 කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අංක 01 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් ඉතා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ඉතිහාසයේ පියා ලෙස සලකනු ලබන හෙරඩෝටස්,
1. ග්‍රීක ජාතිකයෙකි. 2. රෝම ජාතිකයෙකි.
3. ඉතාලි ජාතිකයෙකි. 4. අරාබි ජාතිකයෙකි.

(02) දඩයම් යුගයේ මිනිසා ලැබූ ලොකුම ජයග්‍රහණය වූයේ මින් කුමක් ද?
1. රෝදය සොයා ගැනීම. 2. ලෝහ ආයුධ භාවිතය.
3. නිවාස ඉදිකිරීම. 4. ගින්දර සොයා ගැනීම.

(03) බෝග වගාව හා සත්ත්ව පාලනය/ ස්ථිර වාසස්ථාන ගොඩ නඟා ගැනීම යන මෙම ලක්ෂණයන් ඉතිහාසයේ කවර යුගයක් හා සමීපව සම්බන්ධ වේ ද?
1. එඬේර යුගය. 2. ගොවි යුගය.
3. දඩයම් යුගය. 4. නූතන යුගය.

(04) ඉන්දියාවේ තාම්‍රලිප්ත වරායෙන් නැව් නැඟ ලංකාවේ ගෝකණ්ණ වරායට පිවිසි ආර්ය ජන කණ්ඩායමට අයත් වූයේ,
1. භද්දකච්චානා ඇතුළු පිරිසය. 2. පඬුවස්දෙව් ඇතුළු පිරිසය.
3. විජය ඇතුළු පිරිසය. 4. විජායි කුමරිය ඇතුළු පිරිසය.

(05) “උම්මග්ග ජල මාතිකා” හෙවත් උමං ඔස්සේ ජලය ගෙන යැමේ තාක්ෂණය මුල් වරට හඳුන්වා දීමේ ගෞරවය හිමි වන්නේ,
1. මහසෙන් රජුටය. 2. පළමු අග්බෝ රජුටය.
3. ධාතුසේන රජුටය. 4. වසභ රජුටය.

(06) අනුරාධ ග්‍රාමයට උතුරින් කනදරා ඔය අසල පිහිටුවා ගත් මුල් ආර්ය ජනාවාසයකි,
1. උරුවේල ගාම. 2. විජිත ගාම.
3. තම්බපණ්ණි. 4. උපතිස්ස ගාම.

(07) තිසා වැව, වලස් වැව, යන වැව් ඉදි කළ රජතුමා ලෙස සැලකෙන්නේ,
1. පණ්ඩුකාභය රජුය. 2. දේවානම්පියතිස්ස රජුය.
3. ධාතුසේන රජුය. 4. මහසෙන් රජුය.

(08) මහමෙවුනා උයන ඉදි කරන ලද්දේ මින් කවර රජතුමා විසින් ද?
1. මුටසීව රජු 2. දේවානම්පියතිස්ස රජු
3. පණ්ඩුකාභය රජු 4. දුටුගැමුණු රජු

(09) මහා වංසයේ සඳහන් වන පරිදි, ඇල් කෙත්වල ගොයම් කපා ලැබූ වැටුපෙන් භික්ෂූන්ට දන් පිළි ගැන්වූ රජතුමා වන්නේ,
1. දෙවැනි මිහිඳු රජු ය. 2. මහා චූළ මහාතිස්ස රජු ය.
3. දේවානම්පියතිස්ස රජු ය. 4. දෙවැනි මුගලන් රජු ය.

(10) පහත දී ඇති ප්‍රකාශවලින් ඉතා නිවැරදි ප්‍රකාශය තෝරන්න,
1. වැවක අතිරික්ත ජලය පිට කරන්නේ සොරොව්වෙනි.
2. සොරොව්වෙන් ජලය ලබා දීමේ දී ඇති වන ජල පීඩනය පාලනය කරන්නේ බිසෝ කොටුවෙනි.
3. පිටවාන මගින් සිදු කරන කාර්යය වන්නේ වැව් බැම්ම සේදී යෑමෙන් ආරක්ෂා කිරීමයි.
4. වැවේ ඇති ජලය ඇළ මාර්ගයට මුදා හරින්නේ රළපනාව මගිනි.

(11) අනුරාධපුරයේ සිට පැමිණ මාගම අගනුවර කොටගෙන අලුත් රාජ්‍යයක් ආරම්භ කළ රජතුමා,
1. මහානාග රජු.
2. යටාලතිස්ස රජු.
3. කාවන්තිස්ස රජු.
4. ගෝඨාභය රජු.

(12) මහා වංසයේ සඳහන් වන පරිදි විජය කුමරු ඇතුළු පිරිස ලංකාවට පැමිණි දිනයේ සිදු වූ විශේෂ සිදුවීමකි,
1. මිහිඳු හිමියන් ඇතුළු පිරිස ලක්දිවට වැඩම කරවීම.
2. භද්දකච්චානා කුමරිය ඇතුළු පිරිස ඉන්දියාවෙන් පිටත් වීම.
3. බුදුන් වහන්සේ පිරිනිවන් පෑම.
4. බුදුන් වහන්සේ මහියංගනයට වැඩම කිරීම.

(13) ශ්‍රී ලංකාවේ ආර්ය අනාර්ය ජනපද එක්සේසත් කළ පාලකයා ලෙස සැලකෙන්නේ,
1. විජය රජු ය.
2. පණ්ඩුකාභය රජු ය.
3. දේවානම්පියතිස්ස රජු ය.
4. දුටුගැමුණු රජු ය.

(14) මහා පාලි දාන ශාලාව, ඉසුරුමුණි විහාරය, ජම්බුකෝළ විහාරය කරවන ලදැයි සැලකෙන රජතුමා කවුරුන් ද?
1. වළගම්බා රජු.
2. මුටසීව රජු.
3. දුටුගැමුණු රජු.
4. දේවානම්පියතිස්ස රජු.

(15) බුදුන් වහන්සේගේ දකුණු අකු ධාතුව නිදන් කොට අනුරාධපුරයේ තනවන ලද ඓතිහාසික ස්තූපය වන්නේ මින් කුමක් ද?
1. ගිරිභඬු සෑය.
2. රුවන්වැලි සෑය.
3. ථූපාරාමය.
4. අභයගිරිය.

(16) විජය කුමරු ඇතුළු පිරිස මෙරටට පැමිණි කාලයේ දී මහියංගන ප්‍රදේශය හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?
1. ලංකාපුර.
2. සිරිසවත්ථුපුර.
3. කල්‍යාණී.
4. මාගම්පුර.

(17) ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට නගර නිර්මාණය කළ රජතුමා වන්නේ,
1. විජය රජුය.
2. පඬුවස්දෙව් රජුය.
3. වළගම්බා රජුය.
4. පණ්ඩුකාභය රජුය.

(18) පහත "අ" තීරුව සමඟ "ආ" තීරුව ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| (i) මහසෙන් රජතුමා | A. අභය වැව |
| (ii) ධාතුසේන රජතුමා | B. කලා වැව |
| (iii) පණ්ඩුකාභය රජතුමා | C. මින්නේරි වැව |
| (iv) දෙවන අග්බෝ රජතුමා | D. කන්තලේ වැව |

**1. ABCD** **2. CABD** **3. CBAD** **4. BCAD**

(19) පාහියන් නම් චීන භික්ෂූන් වහන්සේ මෙරටට පැමිණ වසර තුනක් පමණ කාලයක් අධ්‍යාපනය හැදෑරූ අනුරාධපුර යුගයට අයත් ආගමික මධ්‍යස්ථානයක් ලෙස වැදගත් වන්නේ,
1. මහා විහාරයයි.
2. ජේතවනාරාමයයි.
3. අභයගිරියයි.
4. ලෝවාමහාපායයි.

(20) "මාගේ මේ ව්‍යායාමය කිසි කලෙකත් රජ සැප පිණිස නොවේ. හුදෙක් බුද්ධ ශාසනය නගා සිටුවීම පිණිසමය". මෙම ප්‍රකාශය කළ රජතුමා කවුරුන් ද?
1. දේවානම්පියතිස්ස රජු.
2. දුටුගැමුණු රජු.
3. පණ්ඩුකාභය රජතුමා.
4. කාවන්තිස්ස රජතුමා.

## II කොටස

- පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු වන ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(1) තුන් වැනි වාරයට නියමිත පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රියාකාරකම අනු ව, ඔබ විසින් සකස් කළ තොරතුරු වගුව ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**(i)** තොරතුරු සඳහන් කිරීම සඳහා අවශ්‍ය වන තොරතුරු වගුව සකස් කර ගන්නා ආකාරය පිළිබඳ ගුරුතුමිය ඔබට ලබා දුන් උපදෙස් දෙකක් ලියන්න. (ල. 2)

**(ii)** පහත සඳහන් වන්නේ ඔබ විසින් සකස් කළ තොරතුරු වගුවේ ආකෘතියයි.

| A | B | C | D |
|---|---|---|---|
| | | | |

ඉහත **ABCD** යන ශීර්ෂවලින් දෙකක් සඳහා ඔබ යෙදූ මාතෘකා දෙක ලියන්න. (ල. 2)

**(iii)** එම වගු සටහන සඳහා අතිරේක තොරතුරු ලබා ගැනීමට ඔබ ප්‍රයෝජනයට ගත් මූලාශ්‍ර දෙකක් ලියන්න. (ල. 4)

**(iv)** ඔබ විසින් සකස් කළ වගු සටහනට ඇතුළත් කළ රජවරු හතර දෙනෙක් නම් කරන්න. (ල. 4)

**(v)** ඉන් ඔබ කැමැති රජතුමෙක් පිළිබඳ ඉතා වැදගත් කරුණු දෙකක් ලියන්න. (ල. 4)

(2) **(i)** භද්දකච්චායනා කුමරියගේ සොහොයුරන් දෙදෙනෙකුගේ නම් ලියන්න. (ල. 2)

**(ii)** මෙම ශ්‍රී ලංකා සිතියමේ **ABCD** වලින් දැක්වෙන ගංගා හා ස්ථාන හඳුනා ගන්න.

වරහන තුළින් අදාළ පිළිතුර තෝරා ලියන්න.

**(කලා ඔය, මල්වතු ඔය, තම්බපණ්ණි, දීඝවාපි, ගෝකණ්ණ)**




**A** - ....................................

**B** - ....................................

**C** - ....................................

**D** - .................................... (ල. 4)

**(iii)** යුක්තිය හා සාධාරණත්වය ඉටු කිරීම සම්බන්ධයෙන් එළාර රජතුමා ඉතා ප්‍රසිද්ධ තැනැත්තෙක් බවට ඉදිරිපත් කළ හැකි කරුණු ලියන්න. (ල. 5)

(3) **(i)** දඩයම් යුගයේ ජීවත් වූ මිනිසුන් ආහාරයට ගත් ද්‍රව්‍ය දෙකක් ලියන්න. (ල. 2)

**(ii)** එඬේර යුගයට පියමං කළ මිනිසාගේ විශේෂ හැකියා හතරක් ලියන්න. (ල. 4)

**(iii)** සංචාරක එඬේරුන්ගේ ජීවිතය බෙහෙවින් පීඩාකාරී විය. ඔවුන් මුහුණ දුන් පීඩාවන් තුනක් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ල. 5)

(4) **(i)** පණ්ඩුකාභය රජතුමා විසින් පුරෝහිත තනතුර හා නගර ගුත්තික තනතුරට පත් කළ දෙදෙනා පිළිවෙළින් නම් කරන්න. (ල. 2)

පුරෝහිත -

නගර ගුත්තික -

**(ii)** පණ්ඩුකාභය රජතුමා තම පාලන කටයුතු සාර්ථක කරගැනීමට කටයුතු කළ ආකාරය විස්තර කරන්න. (ල. 4)

**(iii)** පණ්ඩුකාභය රජතුමාගේ කාලයේ ජීවත් වූ ජනතාවගේ ජීවනෝපාය (ජීවන රටාව) පිළිබඳ වගන්ති පහක් ලියන්න. (ල. 5)



(5) **(i)** ඉතා ඈත අතීතයේදී ඉන්දියාව හැඳින්වීම සඳහා භාවිතා කළ නම් දෙකක් ලියන්න. (ල. 2)

**(ii)** **A.** මෙම චිත්‍රයෙන් දැක්වෙන ඓතිහාසික සිදුවීම කුමක්දැයි ලියා දක්වන්න.

**B.** එම පිරිස මෙරටට පැමිණීමට හේතු වූ කාරණය කුමක් දැයි ලියා දක්වන්න. (ල. 2x2 = 4)

**(iii)** බුදු දහම ලැබීම නිසා අප ලද දායාද පිළිබඳව වාක්‍ය පහක් ලියන්න. (ල. 5)

(6) **(i)** දසමහා යෝධයින් අතරින් හතර දෙනෙකුගේ නම් ලියන්න. (ල. 2)

**(ii)** දුටු ගැමුණු රජතුමා නියම කළ රාජ ආඥාවට අනුව එළාර රජුගේ සොහොන අසලින් ගමන් කරන්නෙක් විසින්, එළාර රජු වෙනුවෙන් ගරු බුහුමන් දැක්විය යුත්තේ කෙසේදැයි ලියා දක්වන්න. (ල. 4)

**(iii)** දුටු ගැමුණු රජතුමාගේ ආගමික සේවාව පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ල. 5)

(7) **(i)** පැරණි කාලයේ ගම්වල අධිපතීන් වූ 'ගම්පති' හැඳින්වීමට භාවිත කළ වෙනත් නම් දෙකක් ලියන්න. (ල. 2)

**(ii)** පහත සඳහන් ඉදිකිරීම් සම්බන්ධ රජවරු පිළිවෙළින් නම් කරන්න. (ල. 4)

ලෝවාමහාපාය

යෝධ ඇළ ( ජය ගඟ)

ඇළහැර ඇළ (අලිසාර ඇළ)

ජේතවනාරාමය

**(iii)** අනුරාධපුර යුගයේ ජීවත් වූ ජනතාව ගොවිතැන් කටයුතු සිදු කළ ආකාරය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ල. 5)